# කැදර චූබි රාළ



මෙත්මා ලෝසති දසනායක

කෘතියේ නම - කැදර වූබි රාළ

කතෘගේ නම - එච් ඩබ්ලිව් මෙත්මා ලෝසති දසනායක

කතෘ අයිතිය - එච් ඩබ්ලිව් මෙත්මා ලෝසති දසනායක

කතෘගේ වෙනත් කෘති - නොමැත

ISBN අංකය - ISBN 978-624-206-701-8

කෘතිය පළ කරන දිනය - 2023.12.03

**මේ පොත ලියන්නට**

**මා දිරිගන්වන ලද**

**මහාමායාවේ ගරු විදුහල්පතිතුමිය**

**ඇතුළු**

**සියළු ගුරු මැණිවරුන් පියවරුන් වෙත**

**සෙනෙහසින් පුද කර සිටිමි**

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් **"දිවිය දිනන විද්‍යුත් පොතක්"** ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ **"දිවිය දිනන විද්‍යුත් පොතක්"** ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් ,සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

**ශෂිකලා සේනාධීර**

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.11.01


එකමත් එක කාලෙක ලස්සන චූටි බලු පැටියෙක් හිටියා



එයාගෙ නම චූබි

එයා හරිම දඟ මල්ලක්

දවසක් වුබි පාරෙ යනකොට මස් කට්ටක් දැක්කා




එයා ඒක දැකලා දුවලා ගිහින් අහුලා ගත්තා

එයාට හරිම සතුටුයි

වුබි මස් කට්ට කටේ තියාගෙන
පාලමක් උඩින්
ආඩම්බරයෙන් ගියා




යනකොට එයා පුදුම දෙයක් දැක්කා





පාලම යට වතුරෙ තවත් මස් කට්ටක්

# මස් කටු දෙකයි



ඒක දැකලා චූබ්ගෙ කටට

කෙළ ඉනුවා



වූබි මස් කට්ට ගැන හිත හිතා
පාලම උඩට වෙලා
හිටගෙන කල්පනා කරමින් සිටියා



ඒත් එයාට කිසිම දෙයක්
කල්පනා වුණේ නෑ

එයා සතුටට බුරන්න හදනකොටම කටේ තිබුන මස් කට්ට වතුරට වැටුණා



මස් කට්ට පාවෙලා වතුරෙ ගියා

චූබිට හරිම දුකයි



එයා අඬමින් ගෙදර ගියා

මේ කථාවෙන් අපිට ඉගෙන
ගන්න පාඩමක් තියෙනවා

ඒ තමයි පුංචි අපි
ගොඩක් දේවල්වලට ආසා වුණාට
ඒවා ගන්න කලින් දෙපාරක්
හිතන්න ඕනි කියන එක

පුංචි වුබිට වුණොත්
කෑදර කම නිසා
එයා ළඟ තිබුණු මස් කට්ටත්
නැති වුණු එක...

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දි මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම්, නිර්මාණාත්මක හැකියාවන්, ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි.පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

**දිවිය දිනන විද්‍යුත් පොතක්** ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

**සෙනෙවිරත්න මහලේකම්**

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01

**ISBN අංකය - ISBN 978-624-206-701-8**